# තනතුරු - ඇබෑර්තු

## අමාත්‍ය මණ්ඩල කාර්යාලය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරු පුරප්පාඩු එක (01) ක් පවතින අතර ඒ සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් යදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019.09.12 දිනැති ව නිකුත් කරනු ලැබූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2019 හි ඇමුණුම 02 අනුව සකස් කර ඇති මෙම නිවේදනයේ අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් **2023 ඔක්තෝබර් මස 02 දින** හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතු වේ.

අයදුම්පත යොමු කරන ලිපි කවරයෙ හි වම්පස ඉහළ කෙළවරේ "නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා ඉල්ලුම්පත" ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්පත් එවිය යුතු ලිපිනය : අමාත්‍ය මණ්ඩලයේ ලේකම්,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ලොයිඩ්ස් ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2050/43 හා 2017-12-22 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට සහ අංක 28/2019 හා 2019-09-12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත් කරනු ලැබේ.

04. එම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ විස්තරාත්මක ලකුණු පටිපාටිය පහත දක්වා ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ලොයිඩ්ස් ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

දුරකථන අංකය : 0112329620/0112422438
ෆැක්ස් අංකය : 0112323730
විද්‍යුත් තැපැල් : info@cabinetoffice.gov.lk

## අමාත්‍ය මණ්ඩල කාර්යාලය

### *ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පටිපාටිය*

| *අනු. අංකය* | *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද | | |
| | (I) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සෑම වසරක් සඳහාම ලකුණු 05 ක් ද වසරකට අඩු මාස 06 කට වඩා වැඩි සේවා කාලයක් සඳහා ලකුණු 2 1/2ක් ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 50 | 60 |
| | (II) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතාවයට (නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ලෙස) අදළ පූර්ව පළපුරුද්ද (උපරිම වසර 5ක් සඳහා) වෙනුවෙන් වසරකට ලකුණු 02 බැගින් ද, මාස 06කට වඩා වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 01 බැගින් ද ලබා දෙනු ලැබේ. මාස 06කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 10 | |

| අනු. අංකය | පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| | කුසලතාව<br>(I) අධ්‍යාපන සුදුසුකම් :<br>නිලධාරීන් සේවයට බඳවාගැනීමේ දී සලකා බලනු ලැබූ මූලික සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විශේෂඥතා ක්ෂේත්‍ර වර්ගීකරණයකට අදාළ හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරට අදාළ වූ අධ්‍යාපන සුදුසුකම් පමණක් සැලකීමට ලක්කරනු ලැබේ.<br>අ. පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය - ලකුණු 15<br>ආ. පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 10<br>• ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 15 | |
| | (II) වෘත්තීය සුදුසුකම් :<br>අ. (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (දේශීය/විදේශීය) - ලකුණු 10<br>(ii) එම ක්ෂේත්‍රයේ මාස 06ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා - ලකුණු 05<br>සටහන :<br>පහත දැක්වෙන අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික (Professional Certifications) සඳහා කාල සීමාව නොසලකා ඉහත 02 (II) අ. (i) යටතේ සැලකීමට ලක් කෙරේ.<br>1. BCS / ACS<br>2. Microsoft Certifications<br>3. Sun Certifications<br>4. Cisco Certifications<br>5. CISSP Certifications | 10 | 40 |
| | (III) විශේෂ කාර්යයන්/දායකත්වයන් :<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව සිදු කරන ලද නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>අ. පහත දක්වා ඇති ක්ෂේත්‍ර ආවරණය වන නව නිර්මාණ, වැඩිදියුණු කිරීම්, ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 5ක් සඳහා - ලකුණු 10<br>1. මෘදුකාංග නිර්මාණය/සංවර්ධනය (Software Design/Development)<br>2. ජාල පරිපාලනය (Network Administration)<br>3. පද්ධති පරිපාලනය (System Administration)<br>4. දත්ත පාදම පරිපාලනය (Data Base Administration)<br>5. සාමාන්‍ය තොරතුරු සංනිවේදන කටයුතු සහ වෙනත් (General ICT Tasks & etc.) | 10 | |

| අනු. අංකය | පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| | ආ. පොදු 230 බී ආකෘතියෙන් ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම්/ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ප්‍රශංසා 01ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ප්‍රශංසා 05ක් සඳහා පමණක් එනම් උපරිම ලකුණු 05ක් පමණක් ලබා දෙනු ලබන අතර අයදුම්කරුවෙකුට ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 05ක් ලබා ගැනීමෙන් පසු ඉහත (III) අ. යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා මෙම සුදුසුකම යටතේ ලබා දෙන ඉතිරි ලකුණු 05ක් ද ලබා ගත හැකිය. | | |
| | සැ.යු. :<br>• නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් අයදුම්කරු විසින් ම සිදුකළ බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි.<br>• ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබා ගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය.<br>(iv) සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව<br>අ. නායකත්වය - ලකුණු 02<br>ආ. සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>ඇ. වෘත්තීය ආචාරශීලීභාවය - ලකුණු 01 | 05 | |
| | එකතුව | | 100 |

**අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

*ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට පත්කිරීම සඳහා වන අයදුම්පත්‍රය*

(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

1. සම්පූර්ණ නම :——— මහතා/මහත්මිය/මෙනෙවිය

2. උපන් දිනය :———.

3. ජාතික හැඳුනුම්පත් අංකය :———.

4. සේවා කාලය :

| පන්තිය/ශ්‍රේණිය | සේවා කාලය |
|---|---|
| 1 පන්තිය I ශ්‍රේණිය | |
| 1 පන්තිය II ශ්‍රේණිය | |
| 1 පන්තිය III ශ්‍රේණිය | |

5. දැනට සේවයේ නියුතු තනතුර හා කාර්ය ක්ෂේත්‍රය :————.

6. අධ්‍යාපන සුදුසුකම් :

ලබා ඇති පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිළිබඳ විස්තර :

| පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | වර්ෂය | විශ්ව විද්‍යාලය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

7. වෘත්තීය සුදුසුකම් :————.

8. සම්පූර්ණ කරන ලද විශේෂ කාර්යයන් :

| ඉටු කරන ලද සේවය හා විශේෂ කාර්යයන්/දායකත්වයන්/ජයග්‍රහණයන් | විස්තරය | ආයතන ප්‍රධානියාගේ සහතිකය ඇත/නැත |
|---|---|---|
| | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන
තනතුරු නාමය හා නිල මුද්‍රාව.

(ආ) කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.

I. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත/නැත.
II. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
III. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී ඇත/නැත.
IV. නිලධාරියාට එරෙහි ව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදු වෙමින් පවතී/නොපවතී.
V. පූර්වාසන්න වසර 03 තුළ ලබා ඇති නිවාඩු තොරතුරු

| අනු. අංකය | වර්ෂය | වැටුප් සහිත නිවාඩු | අඩ වැටුප් සහිත නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|---|---|
| | | | | |

ඉහත සඳහන් තොරතුරු නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් , මෙම නිලධාරියා විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහා නිලධාරියා තෝරාගතහොත් ඒ සඳහා ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව/අනුප්‍රාප්තිකයකු පසුව ලබා දීමේ පදනම මත මුදා හැරිය හැකි බවත් කාරුණිකව දන්වමි.

දිනය :————.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන, තනතුරු නාමය හා නිල මුද්‍රාව.

09-05